සීතාවකපුර නගර සභාව

කොළඹ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 15 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සීතාවකපුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ ගණනාවක සිට එකතු වෙමින් පැවති නෛතිකව අයකර ගත නොහැකි හිඟ ආදායම් එකතුව රු.14,250,610ක් කපා හැරීම සඳහා 2018 මාර්තු 06 දින අනුමැතිය ලැබී තිබුණු නමුත් මෙම වටිනාකම 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය වෙනුවෙන් වූ ගිණුම්වලින් කපාහැර තිබුණි.

(ආ) ආදායම් හා වියදම් ගිණුමේ ප්‍රාග්ධන වියදම් යටතේ උපකරණ වැය රු.3,391,289ක් ලෙස දක්වා තිබුණද 2017 වර්ෂයේදී සත්‍ය වශයෙන් මිළදී ගත් උපකරණ වටිනාකම රු.2,964,778 ක් වුයෙන්, ප්‍රාග්ධන වැය රු.426,511 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ජල ටැංකි හා ඉනිමං, වටිනාකම වූ රු.264,000 ක් ලී බඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන අධිකාරි බැංකු ගිණුමට බැරකල යුතු රු.2,466,483ක මුදලක් ගිණුම්වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 නොසැසඳුනු ගිණුම්
------------------------

(අ) ගිණුම් විෂයයන් 03 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා ඒවාට අදාල උපයෝගී ලේඛන අතර රු.64,360,739 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට සේවක ඇප තැන්පත් ගිණුමේ ශේෂය රු.434,179 ක් හා සේවක ඇප තැන්පත් ආයෝජන ගිණුමේ ශේෂය රු.423,179 ක් අතර රු.11,000 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
--------------------

අත්තිකාරම් රු.842,357 ක්, පෞද්ගලික බස් නැවතුම්පල ගාස්තු රු.230,700 ක් හා වෙළඳපල කඩකුලී රු.3,603,200ක් දීර්ඝ කාලයක් තිස්සේ නිරවුල් කරනොගෙන දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් රු.60,607,908 ක් වූ ණය හිමි ශේෂය තුළ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලට ගෙවිය යුතු එකතු ශේෂය රු.6,407,974 ක් වූ අතර, ප්‍රවර්තන වර්ෂයේද එම ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම.
------------------------------------------------------------

සභාව සතු ඉඩම් ගොඩනැගිලි 26 ක් වෙනුවෙන් අයිතිය තහවුරු කරන ඔප්පු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්
--------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.
------------------------------------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 වන වගන්තිය | - | සභා බල ප්‍රදේශය තුල ව්‍යාපෘතියක් ලෙස ප්‍රකාශිත හා අනුමත ව්‍යාපෘතිවලින් පරිසර බලපත්‍රය ලබාගත යුතු ව්‍යාපෘති 10 ක් පාරිසරික බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 371 (5) | 842,357 | සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරින් වෙත නිකුත් කළ නොපියවා ඇති අත්තිකාරම් ශේෂය වසර 06ක සිට පැවත එන නමුත් මේවන තෙක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) වෙනත් චක්‍රලේඛ | | |
| (i) බස්නාහිර පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2016 ජුලි 11 දිනැති | - | පළාත් පාලන ආයතනයන්ට අයිති ඉඩම් හා දේපළ භෞතිකව හදුනා ගැනීම, මිනින්දෝරුවකු මගින් මිනුම් කිරීම |

| | | |
|---|---|---|
| අංක LGD/08/2016 දරන චක්‍රලේඛය | | සම්බන්ධයෙන් 2017 ඔක්තෝබර් 4 දින නිලධාරීන් 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කර තිබුණද මෙවන තෙක් එම ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි. |
| (ii) 1993 නොවැම්බර් 18 දිනැතිඅංක 15 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛය | 140,647 | නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන තැන්පත් ගිණුමේ ඇති මුදල් නාගරික සංවර්ධන අධිකාරියේ පූර්ව අනුමැතිය ලත් සංවර්ධන යෝජනාවන්ට පමණක් යොදාගත යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට තිබු මුදල කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා ආයෝජනය කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.142,356,710 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායමරු.148,152,951ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කල ආදායම | රැස් කල ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස් කල ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 21,095,000 | 21,063,558 | 20,671,264 | 6,441,094 | 18,894,000 | 21,191,271 | 23,079,467 | 6,880,726 |
| (ii) කුලී | 29,328,800 | 30,764,376 | 31,165,161 | 17,229,680 | 23,553,000 | 28,338,254 | 21,517,764 | 3,658,514 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,443,500 | 845,394 | 845,394 | 89,710 | 450,000 | 772,909 | 184,682 | 43,542 |
| (iv) වෙනත් ආදායම් | 30,907,200 | 20,701,300 | 30,418,236 | 1,864,955 | - | - | - | - |

2.2.2 වරිපනම් හා බදු

-------------------

වරිපනම්

-----------

සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය වූ රු.6,432,554 කින් රු.2,779,670 ක් පෙර වර්ෂ වෙනුවෙන් වූ හිඟ වරිපනම් විය.

2.2.3 කුලී

------

කඩකුලී

-----------

(i) සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ කඩකුලි ආදායම වූ රු.3,856,121 කින් රු.1,861,463ක් පෙර වර්ෂ වෙනුවෙන් වූ හිඟකඩ කුලී විය.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට මාළු හා මස් ටෙන්ඩර් කඩකුලී හිඟය රු.252,921 ක් විය.

(iii) නගර සභාව 2017 අගෝස්තු මාසයේ සිට කඩකුලිය සංශෝධනය කර තිබූ නමුත්, සීතාවකපුර ජාතික පොළ හා පොදු වෙළඳපල කඩ කාමර සඳහා සංශෝධනයට පෙර පැවති කුලිය අයකර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්යසාධනය

-----------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

-----------------------------------------------

වැවේ කැලේ පාරිසරික කලාපයේ වැව වටා ගමන් පථය සකස් කිරීම, පඩිපෙළ සකස් කිරීම,පඩිපෙළ කොන්ක්‍රීට් කිරීම සහ යකඩ කණුමත ලී බීරලු හිසක් සවි කිරීම සඳහා 2017 දෙසැම්බර් 29 වන දින රු.2,109,544 ක වියදම් දරා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන තිබුණද එම කර්මාන්තය අවසන් කර නොතිබූ බව 2018 මැයි මස කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොමැති බව නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ) සීතාවකපුර නගර සභාව සතුව පවතින නිල නිවාස 07හි අවුරුදු 20 කට වඩා වැඩි කාලයක සිට එකම නිලධාරීන් පිරිසක් පදිංචිව සිටින අතර අනෙකුත් අවශ්‍යතා ඇති නිලධාරීන් ඉල්ලුම් කර තිබුණද ලබා දීමට කටයුතු කර නොතිබුණි. මෙම නිල නිවාස ලබා දීමේදී එළඹී ගිවිසුමෙහි 2.17 වගන්තියට පටහැනි ලෙස නිවාස සැලැස්ම වෙනස් කර අනවසර ඉදිකිරීම් කර තිබුණි.

(ආ) සභාවට අයත් කොටබොඩවත්ත කසළ අංගනය ආසන්නයේ ආරක්ෂාවට ඉදිකර තිබූ පැති බැම්ම කසළ කන්දේ තෙරපිම මත ස්ථාන තුනකින් පුපුරා තිබූ අතර එය කැඩී ගියහොත් නගර සභාව විසින් ඉදිකර ඇති ප්‍රජාශාලාව හා ග්‍රාම නිලධාරි කාර්යාලය ඇතුළු ගොඩනැගිලි වලට අලාභ හානි වීමේ අවදානමක් පැවතුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය

-------------------------------------------------------------------------------

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 04 | 02 | 02 |
| ද්විතීයික | 51 | 47 | 04 |
| ප්‍රාථමික | 122 | 112 | 10 |
| | 177 | 161 | 16 |

(ආ) කාර්ය මණ්ඩල පුරප්පාඩු

------------------------------

ලේකම් තනතුර, ගණකාධිකාරි තනතුර හා පරිපාලන නිලධාරි තනතුර පුරප්පාඩුව පැවතුණු අතර ඒ සඳහා වෙනත් සේවාවන්වලට අයත් නිලධාරීන් වැඩ බැලීමේ පදනම මත පත්කර තිබුණි.

(ඇ) නිවාඩු

--------

සභාවේ වැටුප් රහිත නිවාඩු ලබාගත් කම්කරු සේවකයින් ගණන 20ක් වූ අතර වර්ෂය පුරා එසේ නිවාඩු ලබා ගැනීම මත ඔවුන්ගෙන් සභාවට ඉටුවිය යුතු සේවය නිසි අයුරින් නොලැබෙන බව නිරීක්ෂණය විය.

(ඇ) සේවක ණය

--------------

ස්ථාන මාරු වී ගිය නිලධාරින් 08 දෙනෙකුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.404,247 ක් අයවිය යුතුව තිබුණු අතර නිලධාරින් 23 දෙනෙකුට අදාල රු.148,097 ක ණය ශේෂය අයකර ගත නොහැකි ණය විය.

3.4 වත්කම් කළමනාකරණය

-----------------------------

නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

(අ) නගර සභාව සතු බස් නැවතුම්පල ගොඩනැගිල්ලේ උඩුමහලේ කඩ කාමර 75 ක වැඩ නිමකර තිබුණද විවෘත කර තිබුනේ කඩ කාමර 18ක් පමණි.

(ආ) නගර සභාව විසින් 2017 වර්ෂය සඳහා සකස්කර තිබූ ක්‍රියාකාරි සැලැස්මට අනුව පිහිටුවා ඇති ප්‍රජා මණ්ඩල 10ක් සහ සම්පත් පියස 02 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

(ඇ) වැවේ කැලේ පාරිසරික කලාපයේ පිහිටා ඇති ප්‍රජා ශාලාව කිසිදු පිළිසකර කිරීමකින් තොරව දිරාපත් වෙමින් පැවතුණි.

3.5 හඳුනාගත් පාඩු

------------------

(අ) පිලිප් ගුණවර්ධන ක්‍රීඩාංගණයේ ජල බිල්පත් සඳහා මුදල් නොගෙවීම මත ජල සැපයුම විසන්ධිකර තිබූ අතර 2017 ඔක්තෝබර් 25 දින නැවත යථා තත්වයට පත්කිරීම සඳහා රු.9,785 ක අමතර වියදමක් දරා තිබුණි.

(ආ) පුවක්පිටිය මහජන පුස්තකාලයේ පරිග්‍රහන ලේඛනවලට අනුව සාමාජිකයින් වෙත බැහැර ගෙන යාමට දුන් පොත් වලින් වටිනාකම රු.5,613 ක් වූ පොත් නැවත භාර දී නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------------

අයවැය පාලනය

--------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ඇස්තමේන්තු කරන ලද ආදායම් හා වියදම් සත්‍ය ආදායම් හා වියදම් අතර සියයට 50 සිට සියයට 100 දක්වා අසාමාන්‍ය විචලනයන් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන ක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) වැයවිෂයයන් 17ක් සඳහා සලසා තිබූ එකතුව රු.785,700 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 15 ක් වෙනුවෙන් රු.18,100,800ක් වෙන්කර තිබුණද එයින් සියයට 50 කට වඩා වැය නොකළ මුදල රු.14,049,007 ක් විය.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| (අ) වත්කම්/දේපළ | ලේඛනගත නොකිරීම හා ආරක්ෂාව තහවුරු නොකිරීම |
| (ආ) සේවක කළමනාකරණය | කාර්ය මණ්ඩලය අනුමතකර නොගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |
| (ඇ) ව්‍යාපෘති | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම හා අවසන් කිරීම ප්‍රමාද කිරීම |